## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ (ප්‍රතිසංස්කරණ) තනතුර
## අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ (ප්‍රතිසංස්කරණ) තනතුරට පත්කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ යෝග්‍ය සහ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව - 01

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ යෝග්‍ය සහ සුදුසුකම්ලත් නිලධාරීන් ඉල්ලුම්කර නොමැති වුවහොත්, වසර 11 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්, මෙම තනතුරේ පූර්ණ කාලීන පදනමින් රාජකාරි ඉටුකිරීම පිණිස සේවයේ යෙදවීම සඳහා පත්කිරීම සලකා බලනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 121 අනුව, රාජකාරි ආවරණය කිරීම පිණිස සේවයේ යෙදවීමේ පත්වීම, තවදුරටත් වසරක කාලයක් දීර්ඝ කිරීමේ හැකියාව සොයා බැලීම සහිතව, උපරිම වශයෙන් වසරක සේවා කාලයක් සඳහා සිදුකරනු ලැබේ.

සෑම අයදුම්කරුවෙකු විසින්ම නිසි පරිදි සකස් කරන ලද සිය අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරය (CV), දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව, ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 යන ලිපිනය වෙත 2023 ඔක්තොම්බර් 26 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත ආකෘති පත්‍රය අනුව සකස් නොකරන ලද අයදුම්පත් <u>දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>

**2.0.** අයදුම්කරුගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ජීව දත්ත පත්‍රිකාව (CV)

**2.1. පළපුරුද්ද සහ වෘත්තිය සුදුසුකම්;**

I. ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ විෂය ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. (ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු සඳහා වන පළපුරුද්ද වෙනුවෙන් ලකුණු වෙන් කරනු ලැබේ)
II. ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.2 (අ) i වගන්තිය අනුව පශ්චාත් උපාධියක් ලබා තිබීම
III. ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ප්‍රවීණත්වයක් ලබාතිබීම

**2.2. ප්‍රබලතාවන්;**

I. සංවාදශීලී සාකච්ඡාව,
II. විෂයගත කරුණු නිරවුල්ව පැහැදිලි කිරීම, සහ
III. ක්‍රමෝපායික ප්‍රවේශය යන ක්ෂේත්‍රවල නිපුණතාව

**2.3. චර්යාත්මක ශක්‍යතාවයන්**

I. පුළුල් පරාසයක් ගවේෂණාත්මකව දැකීම
II. මනා සන්නිවේදනය සහ ආභාසයේ ප්‍රබලතාව
III. වෙනසට අනුගත වීම සහ වැඩි දියුණුවට නැඹුරුව

### 3.0. තෝරා ගැනීමේ ක්‍රමය

සුදුසුකම්ලත් අයදුම්කරුවෙකු තෝරා ගැනීම, අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත පත්‍රිකාව (CV) පදනම් කරගෙන ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතා අනුපිළිවෙල ඇගයීමට භාජනය කර, සම්මුඛ පරීක්ෂණයක් සිදුකරනු ලැබේ. සුදුසුකම්ලත් සීමිත අයදුම්කරුවන් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

සුදුසුකම්ලත් අයදුම්කරුවෙකු තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණයේ දී ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතා අනුපිළිවෙල ඇගයීම පදනම් කරගෙන සිදුකරනු ලැබේ.

### 3.1. ලකුණු ලබාදීමේ පටිපාටිය

### 3.1.1 අධ්‍යක්ෂ (ප්‍රතිසංස්කරණ)

<table>
<tr><th>නිර්ණායකය</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>ඇගයීමේ ක්‍රමවේදය</th></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨත්වය<br><br>වැඩිම ජ්‍යෙෂ්ඨත්වයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණු පිරිනමනු ලබන අතර, අනෙකුත් අයදුම්කරුවන්ට සිය ජ්‍යෙෂ්ඨත්වයේ අනුපිළිවෙලට සමානුපාතිකව ලකුණු පිරිනමනු ලැබේ.<br><br>සටහන:- ලකුණු පිරිනැමීමේ දී සතුටුදායක සේවා කාලය පමණක් සළකා බලනු ලැබේ.</td><td>ලකුණු 50</td><td>අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරය (CV) / සම්මුඛ පරීක්ෂණ</td></tr>
<tr><td>පළපුරුද්ද<br><br>තොරතුරු තාක්ෂණය හෝ ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධීකරණය හෝ විදේශ අරමුදල් සම්පාදනය කරන ව්‍යාපෘතිවල මෙහෙයුම් කටයුතු ඉටුකිරීමෙන් ලබා ඇති පළපුරුද්ද.<br><br>අයදුම්කරු අදාළ විෂය භාරව කටයුතු කර ඇති කාලපරිච්ඡේදයේ ප්‍රමාණය, අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරී පවරන ලද ලිපිවල පිටපත් මත පදනම් කරගෙන තීරණය කරනු ලැබේ. එවැනි සියලුම ලිපි, අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත පත්‍රිකාව (CV) සමඟ ඉදිරිපත් කළ යුතුය.</td><td>පහත සඳහන් පරිදි ලකුණු 20 ක් පිරිනමනු ලැබේ.<br><br>අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරයේ (CV) 4.2 හි සඳහන් කර ඇති පළපුරුද්ද ලකුණු 10<br><br><table><tr><td>අදාළ විෂය පථයට විවෘතාභිමුඛව අනුගතවීමේ කාලය විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණය පිළිබඳ පළපුරුද්ද)</td><td>ලකුණු</td></tr><tr><td>වසර 3≤5</td><td>04</td></tr><tr><td>වසර 5≤6</td><td>08</td></tr><tr><td>වසර 6 ≤</td><td>10</td></tr></table><br>ලකුණු 10</td><td>අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරය (CV) / සම්මුඛ පරීක්ෂණ</td></tr>
</table>

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර සබඳතා ක්ෂේත්‍රය / ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධීකරණය / විදේශ අරමුදල් සම්පාදනය කරන ව්‍යාපෘති මෙහෙය වීම පිළිබඳ ක්ෂේත්‍රවල අදාළ විෂය පථයට විවෘතාභිමුඛව අනුගතවීමේ තරම, දැනුම හෝ ප්‍රවීණත්වයේ ප්‍රබලතාව ඇගයීමට භාජනය කරනු ලැබේ. ලකුණු පිරිනැමීම, පහත ශීර්ෂය යටතේ දැක්වෙන සංක්ෂිප්ත සටහන පදනම් කරගෙන සිදුකරන අතර, එම සංක්ෂිප්ත සටහන, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 අනුව, අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත පත්‍රිකාව (CV) ඇතුළත් කළ යුතුය.<br><br>**ශීර්ෂය**<br><br>රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් ජාත්‍යන්තර සංවිධාන සමඟ ඔබ කටයුතු කර ඇති එක් අභියෝගාත්මක සිද්ධියක් කෙටියෙන් විස්තර කර, පළපුරුද්ද හරහා ඔබ ලබාගෙන ඇති දැනුම පැහැදිළි කරන්න. (උපරිම වචන 150) | ලබා ඇති දැනුම/ප්‍රවීණත්වය, අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරයේ (CV) ප්‍රශ්න අංක 4.3 ට අදාළ උත්තරය සහ සම්මුඛ පරීක්ෂණය සැළකිල්ලට භාජනය කරමින් ඇගයීමට ලක් කරනු ලැබේ.<br><br>ජාත්‍යන්තර සබඳතා ක්ෂේත්‍රය / ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධීකරණය / විදේශ අරමුදල් සම්පාදනය කරන ව්‍යාපෘති මෙහෙය වීම පිළිබඳ ක්ෂේත්‍රවල අදාළ විෂය පථයට විවෘතාභිමුඛව අනුගතවීමේ තරම, දැනුම හෝ ප්‍රවීණත්වයේ ප්‍රබලතාව, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 හි ඇමුණුම II ට අනුකූලව ඇගයීමට භාජනය කරනු ලැබේ. | |
| **වෘත්තීය සුදුසුකම්**<br><br>1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි පිරිනමන ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත්, පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.2 (අ) i හි සඳහන් ක්ෂේත්‍රයත පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br><br>2) තොරතුරු තාක්ෂණය / විදේශීය අරමුදල් සම්පාදනය කරන ව්‍යාපෘති මෙහෙයවීම හෝ සම්බන්ධීකරණය පිළිබඳ පුහුණුව* | **ලකුණු 10**<br><br>අ. පර්යේෂණ පාදක පශ්චාත් උපාධිය - **ලකුණු - 7**<br><br>ආ. පන්ති කාමරයක හැදෑරීමක් මත ලබාගත් පශ්චාත් උපාධිය - **ලකුණු - 6**<br><br>ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - **ලකුණු -4**<br><br>ඈ. උපාධි/පශ්චාත් උපාධි සහතිකය - **ලකුණු - 2**<br><br>අ. මාස 3 ක් හෝ ඊට වැඩි කාලයක් - **ලකුණු - 2**<br><br>ආ. දින 10 ක් හෝ ඊට වැඩි කාලයක් - **ලකුණු - 1**<br><br>ඇ. දින 3 ක් හෝ ඊට වැඩි කාලයක් - **ලකුණු - 0.5** | අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරය (CV) / සම්මුඛ පරීක්ෂණ |

| | | |
|---|---|---|
| 3) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය*<br><br>*ඉහලම සුදුසුකම සඳහා පමණක් ලකුණු පිරිනමනු ලැබේ. | අ. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව/IELTS විභාගයේ සමස්ථ ලකුණු අගය 6.5 හෝ ඊට ඉහළ, TOEFL – IBT 79 හෝ ඊට ඉහළ, TOEFL – CBT 213 හෝ ඊට ඉහළ, TOEFL – PBT හෝ ඊට ඉහළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් වන ශාස්ත්‍රපති උපාධිය - **ලකුණු 02**<br><br>ආ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකය<br>**ලකුණු 01.** | |
| **ප්‍රබලතාවන්**<br><br>ඉහත 2.2 වගන්තියේ පරිදි, අයදුම්කරු පෙළඹවීමකට භාජනය කළ යුතු, කාර්යයන් ඵලදායීව ඉටුකිරීමට තිබිය යුතුය.<br><br>ඉහත 2.2 හි සඳහන් කර ඇති ප්‍රබලතාවන් සඳහා ලකුණු පිරිනමනු ලැබේ. | **ලකුණු 10**<br><br>ලකුණු පිරිනැමීම, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 හි ඇමුණුම II ට අනුකූලව සිදුකරනු ලැබේ. | සම්මුඛ පරීක්ෂණය |
| **චර්යාත්මක ශක්‍යතාවයන්**<br><br>ඉහත 2.3 වගන්තියේ සඳහන් කර ඇති පරිදි, ඵලදායීව සිදු කිරීමට අවශ්‍ය විය යුතු වන කාර්යයන් සහ ක්‍රියාකාරකම්<br><br>2.3 හි සඳහන් කර ඇති චර්යාත්මක ශක්‍යතාවයන් සඳහා ලකුණු පිරිනමනු ලැබේ. | **ලකුණු 10**<br><br>ලකුණු පිරිනැමීම, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 හි ඇමුණුම II ට අනුකූලව සිදුකරනු ලැබේ. | සම්මුඛ පරීක්ෂණය |

සටහන 1: ඉහත ලකුණු දීමේ පටිපාටියේ "පිළිගත් විශ්වවිද්‍යාලය" යනුවෙන් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් අදහස් වේ.

සටහන 2: ඉහත ලකුණු දීමේ පටිපාටියේ සඳහන් කර ඇති සියලුම පශ්චාත් උපාධි සුදුසුකම්, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගෙන තිබිය යුතු වන අතර, වෙනත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනවලින් ලබාගත් එවැනි සුදුසුකම් එම කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබිය යුතුය.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
දිනය ......06-10-2023......